**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය - 2023**

**------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 හි 61 ඡේදයට පටහැනිව අධිකාරිය විසින් පාරිතෝෂික වෙන් කිරීමේදි සේවකයන් අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන තිබුණි. එහිදී සේවකයන්ගේ සේවා කාලය හා වැටුප නිවැරදිව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂිත වෙන්කිරීම රු.15,063,462 ක් වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පාරිතෝෂික ගෙවීම් පනතේ විධිවිධානවලට යටත්ව පාරිතෝෂිකය ගණනය කර ගෙවීම් සිදු කරනු ලබන බව හා එහිදී සේවකයින් අවසන් වරට ලබා ගන්නා ලද වැටුප සහ සේවා කාලය පදනම් කරගෙන ඇතිබව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කළ යුතු අතර පාරිතෝෂිත වෙන් කිරීම් ගණනය කිරීමේදි සේවකයන්ගේ සේවා කාලය හා වැටුප නිවැරදිව සැලකිල්ලට ගතයුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 96 ඡේදයට පටහැනිව අධිකාරිය විසින් වර්ෂ 3 ක ඵලදායී ජීව කාලයක් සහිත 2021 දෙසැම්බර් 03 මිලදීගෙන තිබූ පිරිවැය රු.2,170,800 ක් වූ පරිගණක ප්‍රතිවෛරස් මෘදුකාංග වර්ෂයකට සියයට 10 බැගින් ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් හා අනෙකුත් අස්පෘෂ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයට අදාළව ක්‍රමක්ෂය වියදම පිළිවෙළින් රු.1,146,479 කින් හා රු.13,537,537කින් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.1,146,476ක් අඩුවෙන්ද අස්පෘෂ්‍ය වත්කම් ගිණුමේ ශේෂය රු.14,684,016කින් හා සමුච්චිත අතිරික්ත ගිණුමේ ශේෂය රු.13,537,537කින් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි ඡේද අංක 103 අනුව කටයුතු කරන අතර ඊට අදාල හෙළිදරව් කිරීම් ගිණුම්කරණ සටහන් තුළ ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වල දැක්වෙන පරිදි අස්පෘෂ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා ගාස්තු ආදායම තුල ඇතුළත් ඉදිරි වර්ෂවලට අදාල | උපචිත පදනම යටතේ ආදායම් උපයන අවස්ථාවේ | පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා |

| | | | |
|---|---|---|---|
| | රු.123,980,669 ක ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා කලින් ලද ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ආදායම් ලෙස හඳුනා ගැනීමට අධිකාරියේ ආදායම් ප්‍රතිපත්තිය ලෙස ගෙන ඇති බව. | ගාස්තු ආදායම තුල ඇතුළත් ඉදිරි වර්ෂවලට අදාල ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනයේ පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ අමාත්‍යාංශය විසින් පුහුණු උපකරණ භාවිත තත්ත්වයට ගෙන ඒම සඳහා 2021 වර්ෂයේදී වැය කරන ලද රු.68,483,520 ක් අදාල උපකරණ හා වත්කම් ගිණුම්වලට ප්‍රාග්ධනිත කළ යුතු වුවත් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් පුහුණු උපකරණ ගිණුමේ ශේෂය සහ ගොඩනැගිලි ගිණුමේ ශේෂය එම අගයෙන් පිළිවෙළින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | අංක 176 දරන ජ'නලයෙන් ගොඩනැගිලි ගිණුමෙන් රු.68,483,520 ක් ඉවත් කර මෙම වරද නිවැරදි කර ඇති බව. | වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන අනුව පුස්තකාල පොත්, ලී බඩු හා කාර්යාල උපකරණ, පරිගණක උපාංග හා පුහුණු උපකරණ සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය පිළිවෙලින් රු.183,689 ක්, රු.17,337,769 ක්, රු.58,120,905 ක් හා රු.101,316,642 ක් ලෙස දක්වා තිබුණද විගණනයේදි සිදුකළ ගණනය කිරීම් අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.1,085,846 ක් රු.15,157,964 ක්, රු.61,072,840 ක් හා රු.90,661,425 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.8,980,930 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයේ ඌනතාවය හා ස්ථාවර වත්කම් රු.8,980,930ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මේ වන විට ක්ෂය වෙනසට හේතුව හඳුනා ගෙන ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු කාර්යසාධන දීමනා රු.5,406,178 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ලැබිය යුතු කාර්යසාධන දීමනා එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට වග බලා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව. | වර්ෂයට අදාල කාර්යසාධන දීමනා නිවැරදිව හදුනා ගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂයට අදාල නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර වියදම් රු.29,080,000 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබීමෙන් හා සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතුව තිබූ ශිෂ්‍යාධාර රු.44,526,000 ක් ආදායම් ලෙස දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.73,606,000 ක් වැඩියෙන් ද සමුච්චිත අරමුදල රු.29,080,000 ක් වැඩියෙන් හා ලැබිය යුතු ශිෂ්‍යාධාර ආදායම් රු.44,526,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අමාත්‍යාංශයෙන් මුදල් ලැබීමෙන් පසුව ගෙවීම් සිදු කරන අතර මුදල් පදනම මත ලැබීම් සහ ගෙවීම් වර්ෂයට අදාලව ගිණුම් ගත කොට ඇති බව. | වර්ෂයට අදාල නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්වල දැක්වීම කළ යුතුය. |
| (ඊ) | කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පාඨමාලා හදාරනු ලබන සිසුන්ගේ සුභසාධන කටයුතු | සුභසාධන අරමුදල් ව්‍යවස්ථාවෙහි වගන්ති | සිසුන්ගේ සුභසාධන කටයුතු සඳහා |

| | | | |
|---|---|---|---|
| | සඳහා සමාලෝචිත වර්ෂය තුලදී අයකර තිබුණු රු.2,456,000 ක් අදාල අරමුදල් ගිණුමට බැර කිරීම වෙනුවට අධිකාරියේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා සුභසාධන අරමුදල් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රකාරව අතිරික්ත මුදල් නැවත ශිෂ්‍යයන් වෙත ලබා නොදෙන අතර ආයතනයේ පුහුණු කටයුතු සංවර්ධන වැඩසටහන් සඳහා අවශ්‍ය විටදී උපයෝජනය කර ගනු ලබන බව. | අයකරනු ලබන මුදල් අදාල අරමුදල් ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් රු.38,281,274 ක් මුදල් ගලායෑම් ලෙස දැක්විය යුතු වුවත් එය රු.42,175,247ක් ලෙස දැක්වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.3,893,973 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වරද ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හා වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු ශේෂය | 2,929,000 | 10,766,575 | 7,837,575 | මෙම වෙනසට හේතු වන අධිකාරිය හා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතනය මඟින් සහතිකපත් නිකුත් කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළුව නිරාකරණය කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතනය සමඟ විධිමත් ක්‍රමවේදයකට අනුව සහතික පත් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.7**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා අධිකාරිය විසින් මිලදී ගැනීමේ හා වෙනත් අවශ්‍යතා වෙනුවෙන් බාහිර පාර්ශවයන් 89 ක් වෙත ලබා දී තිබූ එකතුව රු.6,685,455 ක මුදල් අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම්කරණ ක්‍රමයේ වැරදි නිසා පෙර සිදු වී ඇති වරදක් බව පෙනෙන්නට ඇති අතර 2023 වසරේ සිට ආරම්භ කළ නව Chart of Accounts තුළින් මේ වන විට වර්තමාන ගනුදෙනු නිවැරදි ලෙස ගිණුම් ගත කරන බව | කඩිනමින් මෙම අත්තිකාරම් මුදල් නිරවුල්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අධිකාරියේ සේවයෙන් ඉවත්වී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.1,592,757ක ණය හා අත්තිකාරම් එම නිලධාරීන් සේවයෙන් ඉවත්වන අවස්ථාවේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට රු.247,452 ක් අයකර ගෙන ඇති අතර ඉදිරියේදී ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | අධිකාරියට අයවිය යුතු ණය හා අත්තිකාරම් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළයුතු අතර නිලධාරීන් සේවයෙන් |

ඉවත්වන අවස්ථාවේදී අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතේ<br>i. 15(1) වගන්තිය | අධිකාරියේ ජාතික ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අර්ධ කාලීන පාඨමාලා 37 න් කිසිදු පාඨමාලාවක් කොමිෂන් සභාවේ ලියාපදිංචි කර නොතිබුණි. | මේ සම්බන්ධව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හා සාකච්ඡා කර ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව . | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභා පනතෙහි විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| | ii. 2 කොටසේ vi පරිච්ඡේදයේ 37(උ) වගන්තිය | වෘත්තිය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම වෙනුවෙන් අධිකාරිය විසින් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුලදී කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. | 2020, 2021 සහ 2022 යන වර්ෂ වල රටේ පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා පුහුණු ආයතන වල සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාකාරකම් කිරීමට නොහැකි වූ අතර,2023 වර්ෂය තුළ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කරන ලද බව | පනතෙහි දක්වා ඇති පරිදි වෘත්තිය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම සඳහා වූ කාර්යයන් ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396 (ඇ) වගන්තිය | නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොකර මාස 06 ක කාලයක් ඉකුත් වූ එකතුව රු.1,298,541 ක් වටිනාකමැති චෙක්පත් 72 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එම චෙක්පත්වලින් රු.243,791 ක වටිනාකම් සහිත චෙක්පත් 44 ක් මුදල් රෙගුලාසි 396 (ඇ) අනුව 2024 අප්‍රේල් මාසය වන විට ආදායමට බැර කර ඇති බව. | මාස 06 ඉක්මවූ සියළුම චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 02/2015 හා 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | දුරකථන දීමනාව හිමි නොමැති මාණ්ඩලික නොවන තනතුරු දරන නිලධාරීන් වෙත ලබා දී තිබූ දුරකථන සම්බන්ධතා වෙනුවෙන් අධිකාරිය විසින් 2018 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු.6,462,922 ක් මාසික බිල්පත් වශයෙන් පුද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි. | රාජකාරී අවශ්‍යතාවය මත මාණ්ඩලික නොවන තනතුරු දරන නිලධාරින් සඳහා ආයතනය විසින් ලබා දී තිබූ දුරකතන සම්බන්ධතාවයට අදාල මාසික ගාස්තුව ලෙස රු.100 ක් හා රජයේ බදු මුදල් පමණක් පුද්ගලික දුරකතන සමාගම වෙත ගෙවන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.81,595,958 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,715,737 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.74,880,221 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ක්ෂය වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති වටිනාකම තුළ ඇතුළත් රු.73,804,932ක් වූ පුහුණු උපකරණ 2024 අගෝස්තු 16 දින දක්වාම කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වෙත ලැබී නොතිබුණි. තවද වටිනාකම රු.87,588,591ක් වූ පුහුණු උපකරණ භාවිතයට ගතහැකි වන පරිදි ස්ථාපිත නොකිරීම සහ එම උපකරණ භාවිතයට ගැනීමට අවශ්‍ය අනෙක් උපකරණ නොලැබීම හේතුවෙන් වසර 02කට අධික කාලයක සිට ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | නොලැබුණු පුහුණු උපකරණ පිළිබඳ ලේඛනයක් අමාත්‍යාංශය මඟින් පත් කරන ලද අධීක්ෂණ නිලධාරීන්ට හා KIP ආයතනය වෙත දන්වා යවා ඇති නමුත් මේ වන තෙක් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව. | ආයතනය වෙත ලැබී නොතිබුණ උපකරණ සම්බන්ධයෙන් පරීක්ෂා කර කඩිනමින් අදාල උපකරණ ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේදී ආංශික නිපුණතා සංවර්ධන අරමුදල මගින් අධිකාරිය වෙත ලබා දීමට එකඟ වී තිබූ එහෙත් 2014 වර්ෂයේදී සිදුකරන ලද ප්‍රසම්පාදන අක්‍රමිකතාවයක් හේතුවෙන් රු.මිලියන 29 ක් අහිමි වී තිබුණි. මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිළධාරින්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම රු. මිලියන 29.9 ක මුදල 2023 වර්ෂයේ දී රඳවා ගත් ලාභයට ගලපා ගිණුම් වලින් ඉවත් කල අතර ඒ සඳහා 2024 මැයි මස පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම මඟින් අනුමැතිය ලැබී ඇති බව. | ප්‍රසම්පාදන අක්‍රමිකතාවයක් හේතුවෙන් අධිකාරියට රු.මිලියන 29 ක් අහිමි වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ට විරුද්ධව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියට අයත් ජාතික ආයතන 03 මඟින් ආධුනික සිසුන්ගෙන් ශිෂ්‍ය සුභසාධන අරමුදලට අයකරනු ලබන මුදල් සුබසාධක කටයුතු සඳහා යෙදවීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.48,995,619 ක් ආයෝජනය කර තිබුණි. | ශිෂ්‍ය සුභසාධක ව්‍යවස්ථා ප්‍රකාරව නැවත ලබා දීමේ පදනම මත පාඨමාලා ආරම්භයේදී සිසුන්ගෙන් අය කරනු ලබන මුදල ස්ථාවර තැන්පතු ගිණුමක රැඳවීමටත් එම පොලිය සිසුන්ගේ ක්ෂේත්‍ර චාරිකා හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට අනුමැතිය ඇත. පාඨමාලා අවසන් වූ පසු එම මුදල සිසුන් හට ලබා දීම හෝ ඔවුන්ගේ කැමැත්ත මත සහතික ප්‍රධානෝත්සවය සඳහා යොදවා ගැනීමට කටයුතු කරනු ලබන බව. | ආපසු ගෙවීමේ පදනම මත සිසුන්ගෙන් අයකර සුභසාධනය වෙනුවෙන් භාවිතා නොකළ මුදල් නැවත සිසුන් වෙත ගෙවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |
| (ඈ) | අධිකාරියට අයත් ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු පුහුණු ආයතනයේ සිසුන්ගෙන් ආපසු ගෙවීමේ පදනම මත පෙර වර්ෂවලදී අයකරගෙන තිබුණු එකතුව රු.7,024,147 කින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු මුදලක් නැවත සිසුන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි. | 2016 වර්ෂයෙන් පසුව කිසිදු ළමයෙකු ඉල්ලීමක් සිදු කර නොමැති බව. | ආපසු ගෙවීමේ පදනම මත පෙර වර්ෂවලදී සිසුන්ගෙන් අයකරගෙන තිබුණු මුදල් නැවත සිසුන් වෙත ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතෙහි අරමුණු වලින් බැහැරව විධිමත් අනුමැතියකින්ද තොරව පුද්ගලයන් විදේශ රැකියා සඳහා යොමු කිරීමේ අරමුණින් 2022 මාර්තු 16 දින NAITA Foreign Employment (Pvt) Ltd නමින් පෞද්ගලික සමාගමක් පිහිටුවා ගෙන තිබුණි. පුද්ගලයන් 121 දෙනෙකුගෙන් ලබාගත් රු.1,270,500ක් අධිකාරියේ බැංකු ගිණුමට බැර කර ඉන් විධිමත් පත්වීමක් නොමැති පුද්ගලයෙකුට වැටුප් හා ඉන්ධන දීමනා ගෙවීම සඳහා රු.402,955 ක් ද විදේශ සේවා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි කිරීම සඳහා රු.448,000 ක් ද වැයකර තිබුණි. | අදාල සමාගම විසින් කිසිදු පුද්ගලයෙක් විදේශ ගත කර නොමැති අතර 2023 වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයට පෙනී නොසිටි රැකියා අයදුම්කරුවන් 42 කට රු.10,500 බැගින් මුදල් ආපසු ගෙවීමට කටයුතු කර ඇති බව. | පනතෙහි අරමුණු වලින් බැහැරව හා විධිමත් අනුමැතියක් නොමැතිව පිහිට වන ලද පෞද්ගලික සමාගම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සමත් වී විදේශ රැකියා නොලැබූ පුද්ගලයන්ට ඔවුන්ගෙන් අයකළ මුදල් ආපසු ගෙවීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | අධිකාරියේ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පුහුණු කටයුතු සඳහා යෝග්‍ය නොවන තෙවන පාර්ශවයක් විසින් ආනයනය කරන ලද අධි ධාරිතාවයකින් යුතු මෝටර් රථයක් නිදහස් කර ගැනීමට රේඛීය අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුව 2017 වර්ෂයේදි අධිකාරිය විසින් රේගු, වරාය හා නිෂ්කාශන ගාස්තු ලෙස රු.16,510,115 ක් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම රථය පුහුණු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | NVQ 04 හදාරන සිසුන් විසින් එවැනි අධිතාක්ෂණයකින් යුතු රථයක් ගැලවීම හා සවිකිරීමට තරම් දැනුමක් හා හැකියාවක් නොමැති අතර සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරම් සඳහා විශාල වාහන ප්‍රමාණයක් මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සතුව පවතින බව. | ආයතනයේ පුහුණු කටයුතු සඳහා යෝග්‍ය වන පුහුණු උපකරණ මිල දී ගැනීම සඳහා සහ මිල දී ගත් රථය ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වාර්ෂිකව සිසුන් 100 කට අධික සංඛ්‍යාවක් බඳවාගෙන තිබූ සිවිල් ඉංජිනේරු අංශය වෙත කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණු කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් රු.286,330,412 ක ඉන්වෙන්ට්‍රිගත හා ඉන්වෙන්ට්‍රිගත නොවන උපකරණ ලැබී තිබුණද 2022 හා 2023 වර්ෂ සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 41ක් හා 18 ක් දක්වා අඩු වී තිබීම තුලින් මෙම ඉහල වටිනාකමැති පුහුණු උපකරණ උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි උපයෝජනය කර නොතිබුණි. | සිසුන් බඳවාගැනීම් වැඩිකර ගැනීම සඳහා නව තාක්ෂණික ඩිප්ලෝමාවක් හා උසස් තාක්ෂණික ඩිප්ලෝමාවක් මෙම වසර තුල ආරම්භ කිරීමට සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතින බව. | විදේශාධාර(ණය) ලෙස ලබාගත් ව්‍යාපෘතිය අනුමත කර ගැනීමේදි සැලසුම් කර තිබූ පරිදි බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කර ගනිමින් මෙම ව්‍යාපෘතිය මගින් ලැබී තිබූ වත්කම් වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට අධිකාරිය කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී සිසුන් 70 ක් බඳවා ගෙන තිබූ Mechanical General Engineering පාඨමාලාව සඳහා 2021 වර්ෂයේදි රු.661,111,008 ක වටිනා උපකරණ ලැබී තිබුණද මෙම උපකරණ ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු සැලසුම් කර නොතිබීම හේතුවෙන් 2022 හා 2023 වර්ෂයන්හිදී ඇතුලත්ව තිබුණු සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් 31 ක් හා 25 ක් විය. ඒ අනුව 2020 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ සිසුන් බඳවාගැනීම් සියයට 64 කින් අඩු වී තිබුණි. | මෙම ක්ෂේත්‍රයෙහි රැකියාවල අඩුවීමක් ද ඇති වීම මත සිසුන් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයට හා යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයන්ට යොමු වීමේ අඩු වීමක් සිදු වූ බව | ව්‍යාපෘතිය අනුමත කර ගැනීමේදි සැලසුම් කර තිබූ පරිදි බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කර ගනිමින් මෙම වත්කම් වලින් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට අධිකාරිය කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මගින් අධිකාරිය වෙත ලබා දී තිබූ 2021 වර්ෂයේ සිට පැවත එන රු.7,699,518 ක් අදාල ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීමට භාවිතා කර නොතිබූ අතර ඉන් රු.7,000,000 ක් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | ව්‍යාපෘතිය අවසන් වීම හේතුවෙන් පැවති රු.7,699,518 ක ශේෂය සම්බන්ධයෙන් යම් තීරණයක් ගන්නා තෙක් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරන ඇති බව. | අදාළ අරමුණ ඉටුකර ගැනීම සඳහා ලබා දෙන මුදල් අප්‍රමාදව එම කාර්යය වෙනුවෙන් යෙදවිය යුතුය. |
| (ඈ) | විධිමත් බඳවාගැනීමේ ක්‍රමවේදයකින් හා පත්වීම් ලිපි නිකුත් කිරීමකින් තොරව ජාතික ආයතන තුන සඳහා බාහිර උපදේශකවරුන් බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළදී පමණක් බාහිර උපදේශක දීමනා ලෙස රු.99,034,763 ක් ගෙවා තිබුණි. | බාහිර උපදේශකවරුන්ට අදාල දීමනා හා ව්‍යවස්ථාපිත දීමනා ඇතුලත් පත්වීමේ ලිපියක් නිකුත් කර ඔවුන්ගේ සේවය ලබා ගනු ලැබේ. බාහිර උපදේශක දීමනා ගෙවීම ප්‍රධාන කාර්යාලයේ පුහුණු අංශය හා දිස්ත්‍රික් කාර්යාල මගින් අධීක්ෂණය සිදු කරනු ලබන බව. | විධිමත් බඳවාගැනීමේ ක්‍රමවේදයකින් හා පත්වීම් ලිපි නිකුත් කර බාහිර උපදේශකවරුන් බඳවා ගැනීම් සිදු කළ යුතු අතර ප්‍රධාන කාර්යාලය මගින් විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඔරුගොඩවත්ත පුහුණු මධ්‍යස්ථානය සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් මුලුමනින්ම බැහැර වෙමින් 2022 දෙසැම්බර් 14 දින මිලදී ගෙන තිබූ රු. 1,805,652 ක වටිනාකමින් යුත් වායු සමීකරණ යන්ත්‍ර ප්‍රසම්පාදනය සිදු කිරීමේදී මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කිරීමෙන් පසුව එම සැපයුම්කරුට ගැලපෙන පරිදි සකස් කරන ලද පිරිවිතර හා ව්‍යාජ ප්‍රසම්පාදන ලිපි ඇතුලත් කරමින් සකස්කල ලිපිගොනුවක් විගණනය සඳහා ඉදිරිපත් කර තිබූ අතර එයින් යන්ත්‍ර 02 ක් 2024 ජනවාරි වන විටත් අක්‍රියව පැවතුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු වලක්වා ගනිමින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව නිවැරදි ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ඇත. | මිලදී ගැනීමේ ක්‍රියාවලිය සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතු අතර ව්‍යාජ ලිපිගොනු සකස් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරී සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය. |